## ඉමදුව ප්‍රාදේශීය සභාව

## ගාල්ල දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 28 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව ඉමදුව ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට ඉමදුව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිපල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැටුප් හා දීමනා වෙනුවෙන් ප්‍රතිපූර්ණය කර තිබුණු රු.8,471,255 ක මුදල සියළුම වැඩ සටහන් අතර විභජනය නොකර, පොදු පරිපාලනය වැඩ සටහන යටතේ පමණක් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.1,000,000 ක් වූ ප්‍රාග්ධන ආධාර මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරීම නිසා ණයගැතියන් හා ප්‍රාග්ධන අධාර රු.1,000,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2007 අගෝස්තු 08 දින පුද්ගලික ආයතනයකින් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ ඡායා පිටපත් යන්ත්‍රයෙහි වටිනාකම හා ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් 2012 මාර්තු 20 දින සභාව වෙත ලබා දී තිබූ ඉසුසු කැබ් රථයේ වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) රූඩ් 01 පර්චස් 37.6 ක් වූ ඉමදුව බස් නැවතුම්පොළ භූමියෙහි වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 23,802,020 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 814,678 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 319,637 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 278 | 395 | 224 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 926 | 696 | 360 |
| (iii) | බදු කුලී | 1,280 | 1,370 | 38 |
| (iv) | වෙනත් ආදායම් | 21,913 | 7,764 | 32,034 |

### 2.2.2 අක්කර බදු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.61,614 ක හිඟ අක්කර බදු ශේෂයක් පැවතිය ද, එම බදු මුදල අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 50,000 |
| (ii) | මුද්දර ගාස්තු | 650,000 |

## 2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි අනුමැතිය ලබා නොගෙන සභාව විසින් ආදේශක සේවකයින් 50 දෙනෙක් බඳවාගෙන 2012 වර්ෂය තුළ වැටුප් වශයෙන් රු.6,097,929 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තියේ විධිවිධානයට අනුව අමාත්‍යවරයාගේ අනුමැතිය නොලබා 2012 අගෝස්තු 13 දින ඉමදුව නගරයේ පැවති උත්සවය වෙනුවෙන් රු.29,000 ක් සභා අරමුදලින් වැයකර තිබුණි.

## 2.4 ඉඩම් වෙන්දේසි

**පහත කරුණු නිරීක්ෂනය කරනු ලැබේ.**

**(අ) කුන්දූප්පකන්ද ඉඩම**

පිඹුරු අංක: 4145 B මගින් අක්කර 17 යි පර්චස් 30 ක් වූ කුන්දූප්පකන්ද ඉඩම කැබලි කිරීම සඳහා 2008 මාර්තු 03 දින කැබලි සැලැස්ම අනුමත කර සංවර්ධන බලපත්‍රය ලබා දී තිබුණි. විගණනයේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) ඡේදය අනුව විකුණුම් මිළෙන් 1% ක බද්ද අයකර ගෙන නොතිබුණි.

(ii) සභාවට ලබා දී තිබූ ඉඩම් කැබලි 05 ට අදාල ඔප්පු 2013 පෙබරවාරි 12 දින දක්වා සභාව වෙත ලබාගෙන නොතිබුණි.

(iii) වෙන්දේසි කරන ලද ඉඩමෙන් වීථි වලට අයත් ඉඩම් ප්‍රමාණය අතහැර අක්කර 15 යි රූඩ් 1 යි පර්චර්ස් 3.28 ක් වූ ඉඩමෙන් සභාවට ලබා දියයුතු 10% ක ප්‍රමාණය අක්කර 1 යි රූඩ් 2 යි පර්චර්ස් 4.328 ක් වුවද, සභාවට ලබාගෙන තිබූ ප්‍රමාණය රූඩ් 2 යි පර්චස් 22.95 කි. ඒ අනුව රූඩ් 3 යි පර්චස් 21.38 ක් සභාව විසින් අඩුවෙන් ලබාගෙන තිබූ අතර, සභාවට සිදුව තිබූ මූල්‍ය පාඩුව රු.4,248,833 ක් විය.

**(ආ) අයෝග්‍ය ඉඩම් සභාවට භාරදීම.**

---

සභාවට ලබා දී තිබූ ඉඩම් කැබලි 05 පිළිබඳව 2013 පෙබරවාරි 12 දින සිදුකළ ස්ථානීය පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

| කැබලි අංකය | ලබා දී තිබූ ප්‍රමාණය | | ඉඩමේ ස්වභාවය |
|---|---|---|---|
| | රූඩ් | පර්චස් | |
| 72 | - | 12.85 | හෙල් සහිත බිමකි |
| 122 | 1 | 28.57 | අධි බලැති විදුලි රැහැන් ඉඩම හරහා ඇද තිබූ අතර, ඉඩමේ විදුලි සම්ප්‍රේෂණ කණු දෙකක් ඉදිකර තිබුණි. |
| 141 | - | 9.95 | වර්ගඵලය වර්ග අඩි 200 ක් පමණ වන ජල ටැංකියක් ඉදිකර තිබුණි. |
| 169 | - | 5.06 | ළිදක් පිහිටා ඇති හෙල් බිමකි |
| 183 A | - | 6.52 | ට්‍රාන්ස්ෆෝමරයක් ස්ථාපිතව තිබූ අතර අධි බලැති විදුලි රැහැන් පද්ධතියක් ඉඩම හරහා ඇද තිබුණි. |

**(ඈ) තැන්නහේන ඉඩම**

---

රූඩ් 1 පර්චස් 30 ක් වූ තැන්නහේන ඉඩම පිඹුරුපත් අංක 2913 මඟින් කැබලි 08 කට බෙදා වෙන්කර, කැබලි 07 ක් නේවාසික භාවිතය සඳහා වූ කැබලි සැලැස්ම සභාව 2011 ජුලි 18 දින අනුමත කර තිබුණි.

මේ පිළිබඳව 2013 පෙබරවාරි 12 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අංක 03 කැබැල්ල හැර අනෙකුත් සියළුම කැබලි විකුණා තිබූ බව නිරීක්ෂණය වුවද, විකුණුම් මිලෙන් 1% ක බද්ද අයකර ගෙන නොතිබුණි.

(ii) 2011 ජූලි මස අනුමත කර ඇති මෙම ඉඩම සඳහා වසරක් අවසන්වීමට පෙර අනුකූලතාවය ලබා ගත යුතු වුවද, එසේ ලබා නොගැනීම නිසා අනුකූලතා සහතිකය සඳහා රු.4,000 ක් ද, 2013 පෙබරවාරි මස 12 දින දක්වා දඩ ලෙස රු.10,600 ක් ද ලෙස රු.14,600 ක් සභාවට අයකර ගත යුතුව තිබුණි.

(iii) ඉඩම් කැබලි අංක 02 හි ජලය බැස යාම සඳහා, කැබලි අංක 08 මගින් දක්වා ඇති මාර්ගයෙන් ජලය බැස්සවීමට කාණුවක් යෙදිය යුතුය යන කොන්දේසියට යටත්ව සභාව විසින් සැලැස්ම අනුමත කළද, කාණුවක් සකස් කර නොතිබුණි. එමෙන්ම එම මාර්ගයේ වැටක් ගසා කොටුකර තිබුණි.

**(ඇ) ඉඩම් වෙන්දේසිවලින් නීත්‍යානුකූල ඔප්පු ලබා නොගැනීම**

2008 සහ 2011 වර්ෂවල සභා බලප්‍රදේශය තුළ සිදු කරන ලද ඉඩම් වෙන්දේසි තුනකින් සභාවට ලබා දී තිබූ හෙක්ටයාර් 1.86 ක් වූ ඉඩම් කොටස්වලට අදාල ඔප්පු 2013 පෙබරවාරි 12 දින දක්වා සභාව විසින් ලබාගෙන නොතිබුණි.

**2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂනය කරනු ලැබේ.

(අ) 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව සභාවේ මන්ත්‍රීවරුන් පස් දෙනෙකු විසින් 2012 වර්ෂය සඳහා අදාළ වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

(ආ) සභාවේ සේවය කරනු ලබන ආදේශක හා අනියම් සේවකයන් වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට අර්ධ වාර්ෂික වාර්තා නියමිත දිනට ඉදිරිපත් නොකිරීම මත පනවන ලද අධිභාර වෙනුවෙන් රු.191,505 ක් සභා අරමුදලින් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ගෙවා තිබුණි. 2011 ජූනි සිට 2011

---

දෙසැම්බර් දක්වා කාලසීමාව සඳහා වූ අධිභාර වශයෙන් රු.97,216 ක් විගණන දිනය වූ 2013 පෙබරවාරි 12 දින වන විටද ගෙවිය යුතුව තිබුණි.

(ඇ) 2010 මාර්තු 10 දිනැති හා අංක PF/R/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ලිපිය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි.

(ඉ) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 2.6 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ද සිදුකර නොතිබූ අතර 2006 අගෝස්තු 28 දිනැති හා අංක : PE/F/S/4(xiii) දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය